# (ඇ) කාර්මික නිෂ්පාදනය

## 1. හැඳින්වීම

1973 වර්ෂය සඳහා නිෂ්පාදන කර්මාන්ත පිළිබඳ දත්තයන් ලබා ගන්නා ලද්දේ කර්මාන්ත සහ විද්‍යා කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාර්මික නිෂ්පාදන ආයතන වෙත යවන ලද ප්‍රශ්න මාලා දෙකක් මගිනි. මින් පළමුවැන්න, අමු ද්‍රව්‍ය ගෙන්වා ගැනීම සඳහා විදේශ විනිමය වෙන් කිරීම් ලබා ගන්නා පෞද්ගලික අංශයේ කාර්මික ඒකක වෙත යැවුනු අතර, දෙවැන්න කර්මාන්ත අමාත්‍යාංශයෙන් විදේශ විනිමය වෙන් කිරීම් ලබා නොගන්නා පෞද්ගලික අංශයේ කර්මාන්තයන් සහ රාජ්‍ය අංශයේ කාර්මික සංස්ථාවෙත යැවිනි.

කර්මාන්ත සහ විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙන් යවන ලද ප්‍රශ්න මාලාවෙහි එම අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව, ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සහ අනෙකුත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සහ ආයතන වලට අවශ්‍ය දත්ත ඇතුළත් විය. එහෙයින් එය එවැනි සවිස්තරාත්මක ප්‍රශ්න මාලාවන්ගෙන් පළමුවැන්න විය. මෙම ප්‍රශ්න මාලාවෙහි ස්වරූපය සහ අඩංගු විය යුතු කරුණු කර්මාන්ත සහ විද්‍යා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් එම කාර්ය්‍ය උදෙසා පත් කරන ලද නියෝජිත උප කමිටුවක් විසින් ඒකාබද්ධව තීරණය කරනු ලැබීය. ආණ්ඩුවේ ආයතන මගින් පුද්ගලික ප්‍රශ්න මාලාවන් යැවීම මෙ මගින් වළකිනු ඇතැයි අපේක්ෂා කරනු ලැබීය.

සම්පූර්ණ කරන ලද පෝරම 1974 ජනවාරි මස 31 වැනි දිනට පෙර අමාත්‍යාංශය වෙත එවිය යුතු බව කර්මාන්ත හිමියන් වෙත ගැසට් නිවේදනයකින් සහ පුවත්පත් දැන්වීමක් මගින් දන්වන ලදී. මේය පැහැර හරින කර්මාන්ත හිමියන්ට විරුද්ධව නීතිමය ලෙස ක්‍රියා කරන බවට තර්ජනයක් මෙම දැන්වීමේ තිබූ නමුදු, ප්‍රතිචාරය සතුටුදායක නොවීය. අමාත්‍යාංශයට අනුව, ප්‍රශ්න මාලා 3572 ක් නිකුත් කළ නමුදු, ආපසු ලැබුනේ සම්පූර්ණ කරන ලද ප්‍රශ්න මාලා 1752 ක් පමණි.

## 2. නිෂ්පාදනය

1973 දී පවත්නා මිළ අනුව කාර්මික නිෂ්පාදනයෙහි වටිනාකම රුපියල් ලක්ෂ 26513 ක් විය. මෙය 1972 වසරට වඩා රුපියල් ලක්ෂ 2089 ක හෙවත් සියයට 8·6 ක වැඩිවීමකි. 1972 සහ 1973 යන වර්ෂයන් දෙකෙහිම වාර්තා සැපයූ සමාගම්වල නිෂ්පාදන වටිනාකම රුපියල් ලක්ෂ 21400 විය. මෙය සියයට 8.0 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. සැසඳිය හැකි දත්තයන් මත පදනම් වන නිසා පසුව කී සංඛ්‍යාව 1973 වසර තුළ කර්මාන්තයන්ගේ සාපේක්ෂ ක්‍රියාකාරිත්වය පිළිබඳ වඩා සුදුසු දර්ශකයක් වෙයි. ඒ හා සසඳන විට 1972 වර්ෂය තුලදී මුළු කාර්මික ඒකකයන්ගේ සාමාන්‍ය වර්ධන වේගය සියයට 10·6 ක්ද, 1971 1972 යන යන වර්ෂ දෙක සඳහාම වාර්තා සැපයූ කාර්මික ඒකකයන්ගේ වර්ධන වේගය සියයට 9·7 ක්ද විය.

කෙසේ වුවද, කාර්මික නිෂ්පාදනයේ මෙම වර්ධන අනුපාතයන් පවතින මිල අනුව ගණනය කොට ඇති බවත්, ඒවායින් කාර්මික ක්‍රියාකාරිත්වය භෞතික හෝ මූර්ත වශයෙන් නොදැක්වෙන බවත් අවධාරණය කළ යුතුය. මිල ඉහල යෑම් සැලකිල්ලට ගෙන මූර්ත අගයන්ගෙන් නිෂ්පාදන වටිනාකම මනින ලද්දේ නම් වර්ධන අනුපාතය සැලකිය යුතු ලෙස අඩුවනු ඇත. සමස්ථ කාර්මික අංශය සඳහා අවධමන කාරකයන් නැති හෙයින් ස්ථාවර මිල අනුව දත්තයන් ඉදිරිපත් කිරීමට තැකක් නොදැරිනි. සාමාන්‍ය ස්ථාවරත්වයකින් මෙතෙක් පැවති දේශීය මිල මට්ටම 1973 දී තියුණු ලෙස ඉහල නැගුණි. 1973 ජීවන වියදම් දර්ශකය සියයට 9·7 කින් වැඩිවූ අතර 1972 දී සහ 1971 දී වැඩිවීම් පිළිවෙලින් සියයට 6·3 සහ 2·7 ක් විය. ප්‍රධාන කාර්මික සංස්ථා 13 ක ස්ථාවර මිල අනුව ගණනය කරන ලද නිමැවුම පහල වැටීම මගින්ම 1973 මිල ඉහල යෑම තවදුරටත්

# 1970-73 කාර්මික නිෂ්පාදනය හා

| කාර්මික ගණය | සමාගම් ගණන | | | | සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1970 | 1971 | 1972 | 1973 | 1970 | 1971 | 1972 | 1973 |
| I. ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. .. | 649 | 527 | 304* | 251* | 33734 | 33866 | 32776 | 23879 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. . | 530 | 634 | 639 | 535 | 27069 | 22568 | 29083 | 29994 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) . .. | 11 | 15 | 11 | 8 | 2907 | 4127 | 4668 | 4058 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් .. .. | 74 | 74 | 67 | 63 | 4462 | 4645 | 4323 | 5105 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 244 | 244 | 196 | 169 | 16610 | 16888 | 15769 | 12113 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 67 | 51 | 64 | 71 | 8545 | 9929 | 8595 | 8532 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. | 1 | 1 | 1 | 1 | 963 | 952 | 1011 | 1167 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනය .. .. | 228 | 287 | 280 | 274 | 12448 | 15089 | 21483 | 18663 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොසඳහන්) .. | 49 | 64 | 64 | 47 | 1367 | 2127 | 2453 | 2204 |
| එකතුව .. | 1853 | 1897 | 1626* | 1419 | 108105 | 110191 | 123986 | 105715 |

* 1972 න් පසු පිළිතුරු සැපයූ ආයතන සංඛ්‍යාවේ පහත වැටීමට විශාල වශයෙන් හේතු වූයේ ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත

II (ඇ) 1 සංඛ්‍යා සටහන

# සේවා නියුක්ති සංඛ්‍යාමය විස්තර සම්පිණ්ඩනය

| ශ්‍රමික දින එකතුව (දහස් ගණනින්) | | | | වැටුප් බිල (රුපි. දශ ලක්ෂ) | | | | නිෂ්පාදන වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | | ඒක ශ්‍රම දිනක වැටුප් (රුපියල්) | | | | සේවකයෙකුට වෙන්වන ශ්‍රම දින | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1970 | 1971 | 1972 | 1973 | 1970 | 1971 | 1972 | 1973 | 1970 | 1971 | 1972 | 1973 | 1970 | 1971 | 1972 | 1973 | 1970 | 1971 | 1972 | 1973 |
| 9651 | 7747 | 7856 | 4749 | 64·4 | 70·5 | 82·7 | 59·2 | 684·5 | 743·0 | 798·7 | 919·6 | 6·67 | 9·10 | 10·52 | 12·46 | 286 | 229 | 239 | 199 |
| 7352 | 5254 | 8536 | 7090 | 46·0 | 43·3 | 72·9 | 61·4 | 282·7 | 306·2 | 394·5 | 420·8 | 6·25 | 8·24 | 8·54 | 8·67 | 272 | 233 | 259 | 236 |
| 738 | 798 | 1099 | 1164 | 8·8 | 8·8 | 13·3 | 15·4 | 21·2 | 26·6 | 30·7 | 43·0 | 11·89 | 11·03 | 12·09 | 13·25 | 254 | 193 | 235 | 287 |
| 1195 | 1228 | 1262 | 1303 | 10·7 | 11·9 | 14·6 | 17·3 | 65·0 | 70·3 | 79·1 | 101·0 | 8·92 | 9·69 | 11·52 | 13·24 | 268 | 264 | 291 | 255 |
| 3782 | 4358 | 4504 | 2931 | 39·1 | 72·3 | 82·7 | 57·1 | 439·2 | 530·0 | 563·8 | 543·4 | 10·33 | 16·58 | 18·36 | 19·64 | 278 | 258 | 285 | 242 |
| 2287 | 2193 | 2345 | 2175 | 26·1 | 25·8 | 37·4 | 37·6 | 138·8 | 176·4 | 172·9 | 190·0 | 11·42 | 11·76 | 15·96 | 17·31 | 268 | 221 | 276 | 255 |
| 270 | 220 | 304 | 350 | 2·8 | 4·7 | 3·9 | 7·6 | 38·9 | 58·6 | 67·5 | 53·2 | 10·55 | 21·36 | 12·66 | 21·59 | 280 | 231 | 300 | 300 |
| 3320 | 3960 | 5033 | 4621 | 29·4 | 39·8 | 54·9 | 59·7 | 256·1 | 273 5 | 304·8 | 347·1 | 8·87 | 10·05 | 10.90 | 12·93 | 267 | 262 | 234 | 248 |
| 395 | 474 | 671 | 579 | 2·1 | 2·9 | 5·5 | 6·0 | 18·6 | 23·1 | 30·4 | 33·2 | 5·40 | 6·12 | 8·20 | 10·38 | 289 | 223 | 273 | 263 |
| 28990 | 26232 | 31610 | 24962 | 229·4 | 280·0 | 367·9 | 321·8 | 1945·0 | 2207·7 | 2442·4 | 2651·3 | 7·91 | 10·67 | 11·63 | 12·89 | 276 | 238 | 255 | 238 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංස්ථාව මගින් සුළු බීඩි නිෂ්පාදන ඒකකයන් විශාල සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ඒකාබද්ධ වාර්තාවක් ඉදිරිපත් කිරීමයි.

## 1969/73 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම කර්මාන්තවල

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | | |
|---|---|---|---|---|---|
| | 1969 | 1970 | 1971 | 1972 | 1973 |
| 1· ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | **641·8** | **684·5** | **743·0** | **798·7** | **919·6** |
| (අ) සැකසූ ආහාර .. .. .. | 230·5 | 250·6 | 263·2 | 322·9 | 382·2 |
| (ආ) එළවළු තෙල් වර්ග සහ මේද .. .. | 169·5 | 170·1 | 190·4 | 143·9 | 157·7 |
| (ඇ) කල්තබාගත හැකි සහ ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස් මාළු සහ අනෙකුත් මුහුදු ආහාර .. | 8·6 | 11·8 | 23·2 | 11·5 | 12·5 |
| (ඈ) බිස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රසකැවිලි | 49·9 | 50·5 | 53·1 | 50·2 | 44·3 |
| (ඉ) පාන වර්ග සහ ස්ප්‍රිතු .. .. .. | 77·4 | 94·9 | 88·1 | 96·5 | 94·8 |
| (ඊ) දුම්කොළ .. .. .. | 105·9 | 106·6 | 124·9 | 173·7 | 228·1 |
| 2· රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | **267·1** | **282·7** | **306·2** | **394·5** | **420·8** |
| (අ) ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් හා අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. .. | 56·0 | 64·3 | 70·8 | 66·7 | 64·1 |
| (ආ) නූල් කැටීම, රෙදිපිළි වියීම සහ නිම කිරීම .. | 172·2 | 173·3 | 189·4 | 271·2 | 295·6 |
| (ඇ) පාවහන් සහ සම් නිෂ්පාදිතයන් .. .. | 38·9 | 45·1 | 46·0 | 56·6 | 60·1 |
| 3· දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | **18·0** | **21·2** | **26·6** | **30·7** | **43·0** |
| (අ) දැව නිෂ්පාදිත .. .. .. | 9·2 | 10·4 | 12·8 | 12·7 | 11·6 |
| (ආ) තුනී ලෑලි .. .. .. | 8·8 | 10·8 | 13·8 | 18·0 | 31·4 |
| 4· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ .. .. .. | **62·3** | **65·0** | **70 3** | **79·1** | **101·0** |
| 5· රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය .. .. .. | **249·8** | **439·2** | **530·0** | **563·8** | **543·4** |
| (අ) කාර්මික රසායන ද්‍රව්‍ය .. .. .. | 2·2 | 3·1 | 3·3 | 5·2 | 5·6 |
| (ආ) විවිධ රසායනික නිෂ්පාදිතයන් .. .. | 155·6 | 155·9 | 230·3 | 213·5 | 161·4 |
| (ඇ) පෙට්‍රෝලියම් සහ ගල්අඟුරු නිෂ්පාදිතයන් .. | 11·0 | 191·0 | 198·5 | 259·5 | 288·5 |
| (ඈ) රබර් නිෂ්පාදිතයන් .. .. .. | 52·8 | 56·4 | 60·2 | 67·7 | 67·8 |
| (ඉ) ප්ලාස්ටික් නිෂ්පාදිතයන් .. .. .. | 28·2 | 32·8 | 37·7 | 17·9 | 20·1 |
| 6· ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදනය (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. .. | **123·3** | **138·8** | **176·4** | **172·9** | **190·0** |
| (අ) පිඟන් බඩු .. .. .. | 8·7 | 8·0 | 8·5 | 12·9 | 13·1 |
| (ආ) වීදුරු සහ වීදුරු නිෂ්පාදිතයන් .. .. | 7·7 | 8·1 | 13·9 | 11·9 | 12·8 |
| (ඇ) සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. .. | 89·0 | 104·8 | 116·7 | 110·4 | 131·4 |
| (ඈ) ඉල්මනයිට් නිෂ්පාදනය .. .. .. | 3·1 | 4·7 | 6·2 | 3·7 | 4·8 |
| (ඉ) ගඩොල් සහ උළු .. .. .. | 14·8 | 13·2 | 13·1 | 34·0 | 27·9 |
| 7· මූලික ලෝහ භාණ්ඩ .. .. .. | **28·8** | **38·9** | **58·6** | **67·5** | **53·2** |
| (අ) යකඩ සහ වානේ මූලික කර්මාන්ත .. .. | 28·8 | 38·9 | 58·6 | 67·5 | 53·2 |
| 8· සකස්කරන ලද ලෝහභාණ්ඩ සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය | **226·2** | **256·1** | **273·5** | **304·8** | **347·1** |
| (අ) සකස් කරන ලද ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) | 82·0 | 96·9 | 128·0 | 111·1 | 135·6 |
| (ආ) යන්ත්‍ර සූත්‍ර (විදුලි නොවන යන්ත්‍රසූත්‍ර) සහ ප්‍රවාහන උපකරණ .. .. .. | 77 9 | 70·8 | 57·3 | 98·9 | 102·5 |
| (ඇ) විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම් උපකරණ හා සැපයුම් .. | 66·3 | 88·4 | 88·2 | 94·8 | 109·0 |
| 9· නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) .. | **9·5** | **18·6** | **23·1** | **30 4** | **33·2** |
| එකතුව .. .. .. | **1,626·8** | **1,945.0** | **2,207.7** | **2,442.4** | **2651·3** |

II (ඇ) 2 සංඛ්‍යා සටහන

ස්වරූපය හා ප්‍රධාන නිෂ්පාදන අනුව

| කර්මාන්තයෙහි සියයට ගණන | | | | | මුළු කාර්මික නිෂ්පාදනයේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1969 | 1970 | 1971 | 1972 | 1973 | 1969 | 1970 | 1971 | 1972 | 1973 |
| **100·0** | **100·0** | **100 0** | **100·0** | **100·0** | **39·5** | **35·2** | **33·7** | **32·7** | **34·7** |
| 35·9 | 36·6 | 35·4 | 40·5 | 41·6 | 14·2 | 12·0 | 11·9 | 13·2 | 14·4 |
| 26·4 | 24·9 | 25·6 | 18·0 | 17·1 | 10·4 | 8·7 | 8·6 | 5·9 | 5·9 |
| 1·3 | 1·7 | 3·1 | 1·4 | 1·4 | 0·5 | 0·6 | 1·1 | 0·5 | 0·5 |
| 7·8 | 7·4 | 7·2 | 6·3 | 4·8 | 3·1 | 2·6 | 2·4 | 2·0 | 1·7 |
| 12·1 | 13·9 | 11·9 | 12·1 | 10·3 | 4·8 | 4·9 | 4·0 | 4·0 | 3·6 |
| 16·5 | 15·6 | 16·8 | 21·7 | 24·8 | 6·5 | 5·5 | 5·7 | 7·1 | 8·6 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **16·4** | **14·5** | **13·9** | **16·1** | **15·9** |
| 21·0 | 22·7 | 23·1 | 16·9 | 15·2 | 3·4 | 3·3 | 3·2 | 2·7 | 2·4 |
| 64·5 | 61·3 | 61·9 | 68·8 | 70·5 | 10·6 | 8·9 | 8·6 | 11·1 | 11·2 |
| 14·5 | 16·0 | 15·0 | 14·3 | 14·3 | 2·4 | 2·3 | 2·1 | 2·3 | 2·3 |
| **100·0** | **100 0** | **100·0** | **100·0** | **100·0** | **1·1** | **1·1** | **1·2** | **1·3** | **1·6** |
| 51·1 | 49·1 | 48·1 | 41·4 | 27·0 | 0·6 | 0·5 | 0·6 | 0·5 | 0·4 |
| 48·9 | 50·9 | 51·9 | 58·6 | 73·0 | 0·5 | 0·6 | 0·6 | 0·8 | 1·2 |
| **100·0** | **100·0** | **100·0** | **100 0** | **100·0** | **3·8** | **3·3** | **3·2** | **3·2** | **3·8** |
| **100·0** | **100·0** | **100·0** | **100 0** | **100·0** | **15·3** | **22·6** | **24·0** | **23·1** | **20·5** |
| 0·9 | 0·7 | 0·6 | 0·9 | 1·0 | 0·1 | 0·2 | 0·2 | 0·2 | 0·2 |
| 62·3 | 35·5 | 43·5 | 37·9 | 29·7 | 9·6 | 8·0 | 10·4 | 8·8 | 6·1 |
| 4·4 | 43·5 | 37·4 | 46·0 | 53·1 | 0·7 | 9·8 | 9·0 | 10·6 | 10·9 |
| 21·1 | 12·8 | 11·4 | 12·0 | 12·5 | 3·2 | 2·9 | 2·7 | 2·8 | 2·6 |
| 11·3 | 7·5 | 7·1 | 3·2 | 3·7 | 1·7 | 1·7 | 1·7 | 0·7 | 0·7 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **7·6** | **7·1** | **8·0** | **7·1** | **7·2** |
| 7·1 | 5·8 | 4·8 | 7·5 | 6·9 | 0·5 | 0·4 | 0·4 | 0·5 | 0·5 |
| 6·2 | 5·8 | 7·9 | 6·9 | 6·7 | 0·5 | 0·4 | 0·6 | 0·5 | 0·5 |
| 72·2 | 75·5 | 66·2 | 63·8 | 69·2 | 5·5 | 5·4 | 5·3 | 4·5 | 5·0 |
| 2·5 | 3·4 | 3·5 | 2·1 | 2·5 | 0·2 | 0·2 | 0·3 | 0·2 | 0·2 |
| 12·0 | 9·5 | 17·6 | 19·7 | 14·7 | 0·9 | 0·7 | 1·4 | 1·4 | 1·0 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **1·8** | **2·0** | **2·6** | **2·8** | **2·0** |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 1·8 | 2·0 | 2·6 | 2·8 | 2·0 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100 0** | **13·9** | **13·2** | **12·4** | **12·5** | **13·1** |
| 36·3 | 37·8 | 46·8 | 36·5 | 39·1 | 5·0 | 5·0 | 5·8 | 4·5 | 5·1 |
| 34·4 | 27·6 | 21·0 | 32·4 | 29·5 | 4·8 | 3·6 | 2·6 | 4·1 | 3·9 |
| 29·3 | 34·5 | 32·2 | 31·1 | 31·4 | 4·1 | 4·5 | 4·0 | 3·9 | 4·1 |
| **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **0·6** | **1·0** | **1·0** | **1·2** | **1·2** |
| | | | | | **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

පැහැදිලි කරයි. මෙම සංස්ථාවන්ගේ නිමැවුමේ වටිනාකම වර්තන මිල අනුව මනින විටදී වූ සියයට 18·7, ක වැඩිවීම වෙනුවට ස්ථාවර මිල අනුව මනින විට පෙන්නුම් කරනුයේ සියයට 2 1 ක වැටීමකි. මෙම පසුතලය මත පවතින මිල අනුව කර්මාන්ත වර්ධන අනුපාතය මූර්ත වශයෙන් දක්වන්නේ අසතුටුදායක පිංතූරයකි.

ඉහතකී සංඛ්‍යා මගින් පෙන්නුම් කළ පරිදි 1973 දී කාර්මික ක්‍රියාකාරිත්වය අඩු වීමට, අමු ද්‍රව්‍ය සහ අමතර කොටස් ආයාත කිරීම සඳහා දැඩි විදේශීය විනිමය සීමා පැනවීමත්, ආයාත වෙන් කිරීම්වල මූර්ත වටිනාකම තදින්ම අඩු කරමින් කාර්මික යෙදවුම්වල ලෝක වෙළඳ පොළේ මිළ ඉහළ යාමත් හේතුවූවා විය හැක.

රාජ්‍ය අංශයේ කාර්මික සංස්ථාවන්ගේ නිමැවුම් වටිනාකම 1972 දී රුපියල් ලක්ෂ 8,711 සිට 1973 දී රුපියල් ලක්ෂ 11359 දක්වා වැඩි වූ අතර, මුළු නිමැවුම් වටිනාකමේ අනුපාතයක් වශයෙන් 1972 දී සියයට 35·6 ක්වූ රාජ්‍ය අංශයේ කොටස 1973 දී සියයට 42·8 දක්වා වැඩිවී ඇත. 1973 දී රාජ්‍ය සංස්ථාවන්ගේ නිමැවුම් වර්ධනය, සියයට 8·6 වූ කාර්මික අංශයේ සමස්ථ වර්ධන වේගය හා සසඳන විට ඉතා වැදගත් වේ.

කාර්මික නිෂ්පාදනය පිළිබඳ ප්‍රධාන සංඛ්‍යා සටහන් තුනක් සහ අතිරේක සංඛ්‍යා සටහන් තුනක් මෙම කොටසෙහි ඇතුළත් වේ. පළමුවැනි සංඛ්‍යා සටහන වන II (ඇ) 1 වැනි සංඛ්‍යා සටහන 1970 සිට 1973 දක්වා වර්ෂයන් සඳහා නිෂ්පාදනය සහ සේවා නියුක්තිය පිළිබඳ සම්පූර්ණ සංඛ්‍යාත්මක විස්තරයක් සපයයි. II (ඇ) 2 වැනි සංඛ්‍යා සටහන 1969 සිට 1973 දක්වා වර්ෂයන් සඳහා කර්මාන්ත සහ ප්‍රධාන නිෂ්පාදන අනුව වර්ග කළ නිෂ්පාදන දත්තයන් සපයන අතර II (ඇ) 3 සංඛ්‍යා සටහන 1972 සහ 1973 වර්ෂ දෙක සඳහා වාර්තා සැපයූ කාර්මික ඒකකයන් ගේනිෂ්පාදන දත්තයන් පෙන්නුම් කරයි.

ප්‍රධාන කාර්මික ගණ සහ ඒවායේ අනුරූපී උප ගණ හඳුන්වා දෙන II (ඇ) 2 වැනි සංඛ්‍යා සටහන, 1969 - 1973 දක්වා අවුරුදු පහක කාලසීමාව තුළ පුළුල්වූ හෝ සංකෝචනයවූ ප්‍රධාන ගණ සහ උප ගණ වෙත අවධානය යොමු කරයි. කාර්මික ව්‍යුහය තුළ එක් එක් කාර්මික ගණයන්ගේ සහ උප ගණයන්ගේ සාපේක්ෂ වැදගත්කම පිළිබඳවද මෙම සංඛ්‍යා සටහන සැළකිල්ල යොමු කරයි.

ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයෙහි යෙදුනු කර්මාන්ත ගණය, නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි විශාලම තනි කාර්මික ගණයයි. මෙම ගණයෙහි නිමැවුම් වටිනාකම 1973 දී රුපියල් ලක්ෂ 9196 ක් හෙවත් මුළු නිමැවුමෙන් සියයට 34·7 ක් වී ඇති අතර 1973 දී එහි නිමැවුම් වටිනාකම රුපියල් ලක්ෂ 1209 ක වැඩිවීමක් පෙන්වීය. මෙම ගණය තුළ ප්‍රධාන කාර්මික උප ගණයන් නම් (අ) ආහාර සැකසුම් (ආ) දුම්කොළ සහ (ඇ) එළවළු, තෙල් සහ මේද වේ. පළමුවන උප ගණයෙහි, එනම් ආහාර සැකසුමේ නිෂ්පාදනය විශාල සහ කුඩා සමාගම් ගණනාවක් මගින් සිදු කරනු ලැබේ. සාපේක්ෂ වශයෙන් ඒකක සුළු සංඛ්‍යාවක් මගින් දුම්කොළ නිෂ්පාදනය නියෝජනය වන අතර එළවළු, තෙල් සහ මේද උප ගණයෙහි සමාගම් දෙකක් ප්‍රධාන තැනක් දරයි. මෙම ගණය දරූ ප්‍රමුඛ තත්ත්වයට එහි කෘෂිකාර්මික නැඹුරුව තරමක් දුරට හේතුවූ අතර ඒ සඳහා විදේශ තරඟ කාරිත්වයක් නොමැතිවීම අනික් හේතුව විය. ශ්‍රී ලංකාවේ කාර්මික නිෂ්පාදනයේ සමහර අවස්ථාවන්හිදී පුරෝගාමිකයන්වූ ස්ථාපිත පැරණි කාර්මික සමාගම් සමහරක්ද මෙම ගණය තුළ දක්නට ලැබේ.

රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිපදවන ඒකකයන්ගෙන් දෙවන විශාලතම කාර්මික ගණය සමන්විත වේ. ඉකුත් වසරට වඩා රුපියල් දශලක්ෂ 204 ක අඩුවීමක් පෙන්වමින් මේ ගණයෙහි නිමැවුම් වටිනාකම රුපියල් ලක්ෂ 5434 ක් විය. වටිනාකමේ මෙම සංකෝචනය, විවිධ රසායන ද්‍රව්‍ය නිෂ්පාදන උප ගණයේ රුපියල් ලක්ෂ 521 ක තියුණු වැටීමේ ප්‍රතිඵලයකි. රුපියල් ලක්ෂ 290 කින් වැඩිවූ ඛනිජ තෙල් සහ ගල් අඟුරු නිෂ්පාදන උප ගණය මගින් මෙම අඩුවීමෙන් කොටසක් පියවුනද, 1972 දී පෙන්නුම් කළ රුපියල් දශලක්ෂ 610 ක වැඩිවීම හා සසඳන විට, එය සුළු වැඩිවීමකි. විවිධ රසායන නිෂ්පාදන උප ගණයේ නිෂ්පාදන වටිනාකමෙහි පහත වැටීම, සුවඳ විලවුන්, දත් බෙහෙත් සහ සබන් වැනි නිෂ්පාදන සම්බන්ධව විදේශ විනිමය වෙන් කිරීම අඩු කිරීම සමග කිට්ටුවෙන් සම්බන්ධ වේ.

අනෙක් ප්‍රධාන කාර්මික ගණයන් නම් රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත සහ සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදන කර්මාන්තද වේ. මෙම ගණයන් සිය නිමැවුම් වටිනාකම පිළිවෙලින් රුපියල් ලක්ෂ 263 සහ රුපියල් ලක්ෂ 423 කින් වැඩි කළහ. 1973 දී නිමැවුම් වටිනාකම රුපියල් ලක්ෂ 245 කින් වැඩිවූ (යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හැරුණු) සකස් කළ ලෝහ භාණ්ඩ උප ගණය හැර මෙම ගණ දෙකෙහිම උප ගණයන්හි යැලකිය යුතු වෙනසක් නොවිය. නිමවූ හා අර්ධ වශයෙන් නිමවූ නිෂ්පාදිත රාශියක් සකස් කරන කර්මාන්ත මෙම උප ගණයට අයත් වේ. යන්ත්‍ර සූත්‍ර (විදුලිමය හැර) සහ භූවමාරු උපකරණ සහ විදුලිමය යන්ත්‍ර සූත්‍ර, මෙවලම් උපකරණ සහ සැපයුම් යන කාර්මික උපගණයන්හි ද ආන්තික වැඩිවීම් වාර්තාගත වී ඇත.

අතිරේක II (ඇ) 1 (1) වැනි සංඛ්‍යා සටහන, නිෂ්පාදන වටිනාකමේ වැඩිවීම අනුව කාර්මික උපගණයන්හි වර්ගීකරණයක් සපයයි. සිය නිමැවුම් වටිනාකමේ ඉහළම වැඩිවීමක් වාර්තා කර ඇත්තේ ආහාර සැකසුම් සහ දුම්කොළ යන උප ගණයන්ට ඇතුලත් වන කාර්මික ඒකකයන් බව මෙම සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරයි. ආහාර සැකසුම් උප ගණය ඉකුත් වසරේ මෙන්ම සීඝ්‍රයෙන් වර්ධනය වන බව පෙනෙන්නට තිබේ. එහි නිමැවුම් වටිනාකම රුපියල් ලක්ෂ 500 කටත් වැඩි ප්‍රමාණයකින් වැඩිවී ඇත. පසුගිය වසරේ නිමැවුම වැඩිවීම රුපියල් දශලක්ෂ 50 කට අඩු වුවද මෙම වසරේ දුම්කොළ නිෂ්පාදනයේ වැඩිවීමද රුපියල් ලක්ෂ 500 ඉක්මවා ඇත. වටිනාකම අනුව බැලීමේදී ඉහළ කාණ්ඩයකට එක්වුනු අනෙක් කර්මාන්ත නම් කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත, සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බෙස්ටෝස් නිෂ්පාදිතයන් සහ (යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ හැර) සකස් කළ ලෝහ නිෂ්පාදිත යන කාර්මික උප ගණයන්ය. මෙම උපගණ සිය නිෂ්පාදිත වටිනාකම රුපියල් ලක්ෂ 200-500 අතර ප්‍රමාණයන්ගෙන් වැඩි කර ගත්හ. සමස්ත වශයෙන් 1972 වූ උප ගණ 14 වෙනුවට, 1973 දී උපගණ 21 ක්සිය නිමැවුම් වටිනාකම් වැඩිවීම් වාර්තා කර ඇත.

## II (ඇ) 2 (1) සංඛ්‍යා සටහන

### කාර්මික උප ගණ අනුව නිෂ්පාදන වටිනාකමේ වැඩිවීම

| රු: 0 – රු. දශලක්ෂ 5 දක්වා | රු. දශලක්ෂ 5 – 20 දක්වා | රු. දශලක්ෂ 20 – 50 දක්වා | රු. දශලක්ෂ 50 ට වැඩි |
|---|---|---|---|
| කල් තබා ගත හැකි සහ වින් වල අසුරන ලද පළතුරු, එළවළු, මස් මාළු සහ අනෙකුත් මුහුදු ආහාර | එළවළු තෙල් වර්ග සහ මේද | නූල් කැටීම, රෙදිපිළි වියීම සහ නිම කිරීම | සැකසූ ආහාර |
| | තුනීලෑලි | කඩදාසි සහ කඩදාසි භාණ්ඩ | දුම්කොළ |
| සිසිල්බීම | විදුලි යන්ත්‍රසූත්‍ර මෙවලම් උපකරණ හා සැපයුම් | පෙට්‍රෝලියම් සහ ගල්අඟුරු නිෂ්පාදිතයන් | |
| පාවහන් හා සම් නිෂ්පාදිතයන් | | සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් | |
| කාර්මික රසායනද්‍රව්‍ය | | | |
| රබර් නිෂ්පාදිතයන් | | | |
| ප්ලාස්ටික් නිෂ්පාදිතයන් | | සකස් කරන ලද ලෝහ භාණ්ඩ | |
| පිහන් බඩු | | | |
| විදුරු සහ විදුරු නිෂ්පාදිතයන් | | | |
| ඉල්මනයිට නිෂ්පාදනය | | | |
| යන්ත්‍රසූත්‍ර (විදුලි නොවන) සහ ප්‍රවාහන උපකරණ | | | |
| නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක සඳහන් නොවූ) | | | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අතිරේක II (ඇ) 2 (2) වැනි සංඛ්‍යා සටහන ප්‍රධාන කාර්මික ගණ නවයේ කාර්මික ඒකක සංඛ්‍යාවන්හි වෙනස්වීම් සහ ඊට අනුරූප 1972-73 කාලය තුළ නිෂ්පාදන වටිනාකමේ වෙනස්වීම් පෙන්නුම් කරයි. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික්

නිෂ්පාදිත හැර අනික් සෑම කාර්මික ගණයකම සිය නිමැවුම් වටිනාකම වැඩිවී ඇති බව මෙම සංඛ්‍යා සටහන පෙන්නුම් කරයි. ආහාර පාන වර්ග සහ දුම්කොල ගණයෙහි වාර්තා කරන සමාගම් සංඛ්‍යාවේ අඩුවීමක් ඇති වුවද, නිමැවුම් වටිනාකම රුපියල් ලක්ෂ 1209 කින් වැඩි විය. මෙය කාර්මික ගණයන්හි විශාලතම වැඩිවීමයි. රුපියල් ලක්ෂ 423 ක වැඩිවීමක් දක්වූ සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ ගණය නිමැවුමේ අගය කළ හැකි සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කළ අනික් කාර්මික ගණයයි.

## II (ඇ) 2 (2) සංඛ්‍යා සටහන

### වාර්තා සැපයූ ආයතන සංඛ්‍යාව සහ නිෂ්පාදන වටිනාකම

| | කාර්මික ගණය | වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවේ වෙනස | නිෂ්පාදන වටිනාකමෙහි වෙනස, (රුපියල් දශලක්ෂ) |
|---|---|---|---|
| I. | ආහාරපාන සහ දුම්කොළ .. | – 53 | +120·9 |
| II. | රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්ත .. | –104 | + 26·3 |
| III. | දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදිත .. | – 3 | + 12·3 |
| IV. | කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. | – 4 | + 21·9 |
| V. | රසායනද්‍රව්‍ය, ඛනිජතෙල්, ගල් අඟුරු සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත | – 27 | – 20·4 |
| VI. | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ගල් අඟුරු හා ඛනිජ තෙල් හැර) .. | + 7 | + 17·1 |
| VII. | මූලික ලෝහ නිෂ්පාදිත .. | — | – 14·3 |
| VIII. | සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහණ උපකරණ නිෂ්පාදිත | – 6 | + 42·3 |
| IX. | නිෂ්පාදිත භාණ්ඩ අ. ස. නො. .. | – 17 | + 2·8 |
| | එකතුව | – 207 | +208·9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1969–1973 දක්වා කාලය තුළ සෑම ප්‍රධාන කාර්මික ගණයකම එකතු කළ වටිනාකම, වර්තන මිල අනුව II (ඇ) 2 (3) වැනි සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කරයි. කර්මාන්තයේ මුළු නිෂ්පාදන වටිනාකමින් අමු ද්‍රව්‍ය සහ ඉන්ධනයන්හි වියදම අඩු කිරීමෙන් එකතු කළ අගය ලබා ගෙන ඇත.

## II (ඇ) 2 (3) සංඛ්‍යා සටහන

### ප්‍රධාන කාර්මික ගණ අනුව කර්මාන්තයේ අගය එකතුව

රුපියල් දශලක්ෂ

| | කාර්මික ගණය | 1969 | 1970 | 1971 | 1972 | 1973 |
|---|---|---|---|---|---|---|
| I. | ආහාරපාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 487·8 | 520·2 | 564·7 | 606·9 | 680·9 |
| II. | රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | 146·9 | 155·5 | 168·4 | 217·0 | 192·9 |
| III. | දව සහ දව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 10·4 | 12·3 | 15·4 | 17·8 | 17·9 |
| IV. | කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය .. | 21·8 | 22·8 | 24 6 | 27·7 | 39·2 |
| V. | රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 137·4 | 241·6 | 309·9 | 310·0 | 191·4 |
| VI. | ලෝහ නො වන ඛනිජ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 69·0 | 77·7 | 98·8 | 96·9 | 125·9 |
| VII. | මූලික ලෝහ නිෂ්පාදිතයන් .. | 4·8 | 7·8 | 11·7 | 13·6 | 8·2 |
| VIII. | සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහණ උපකරන නිෂ්පාදනය . | 81·4 | 92·2 | 98·5 | 109·8 | 140·1 |
| IX. | නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොසඳහන්) .. | 2·5 | 4 8 | 6·0 | 7·9 | 13·5 |
| | එකතුව .. .. | 962·0 | 1,134·9 | 1,298 0 | 1,407·6 | 1,410·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1969 සිට 1973 දක්වා අවුරුදු 5 ක කාලය තුළ කර්මාන්තයන්ගේ එකතු කළ අගය වැඩිවීඇත. කෙසේ වුවද, 1973 වර්ෂයේදී වැඩිවීම පසුගිය අවුරුදුවල වාර්තාගතවූ වැඩිවීම් හා සසඳන කළ ඉතා සුලුය මෙය සමහර විට 1973 දී කාර්මික ක්‍රියාකාරිත්වය අඩුවීම නිසා විය හැක. මෙම අඩුවීම.අවාසිදයක ලෙස බලපෑ ගණයක් වූයේ රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන ගණයයි. එහි එකතු කළ අගය රුපියල් ලක්ෂ 1186 ක පහත වැටීමක් පෙන්නුම් කරයි. විදේශ විනිමය වෙන් කිරීම් අඩු කිරීමේ හේතුවෙන් මෙම ගණය උපයෝගී කොට ගත් අමුද්‍රව්‍යයන්ගේ වටිනාකමේ තියුණු අඩුවීමක් ඇතිවී ඇත. මෙය, මෙම අංශය මගින් එකතුකළ අගය කෙරෙහි අවාසිදයක ලෙස බලපෑම් ඇති කරමින්, එහි නිෂ්පාදන වටිනාකමේ අඩුවීමකට මගපාදන ලදී. එකතු කළ අගයෙහි අඩුවීම් වාර්තාගත වූ අනෙක් කාර්මික ගණ දෙක නම් රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත සහ මූලික ලෝහ නිෂ්පාදිතයි.

1972 සහ 1973 යන වර්ෂ දෙකේදීම පිළිතුරු සැපයූ කාර්මික ආයතනයන්ගේ කර්මාන්ත සහ නිෂ්පාදිත අනුව වර්ග කරන ලද නිෂ්පාදන වටිනාකම පිළිබඳ දත්තයන්, II (ඇ) 3 වැනි සංඛ්‍යා සටහන සපයයි. 1972 හා 1973 වර්ෂ දෙක සඳහාම පිළිතුරු සැපයූ කාර්මික ඒකකයන්හි සංඛ්‍යාව 870 ක්වූ අතර, මෙය 1971 සහ 1972 වර්ෂ සඳහා අනුරූපී සංඛ්‍යාව වූ 959 ටවඩා අඩුය.

මෙම කාර්මික ඒකක 870 හේ 1972 දී රුපියල් ලක්ෂ 19811 ක්වූ නිමැවුම් වටිනාකම, 1973 දී රුපියල් ලක්ෂ 21400 වීමෙන් සියයට 8 0 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම සංඛ්‍යා සටහනින් දක්වෙන පරිදි 1973 කාර්මික ක්‍රියාකාරිත්වය සියලුම වාර්තාගත ඒකක පිළිබඳව දත්තයන් සපයන II (ඇ) 2 වැනි සංඛ්‍යා සටහන සමග පුළුල් වශයෙන් සමානකමක් දක්වයි.

II (ඇ) 3 වැනි සංඛ්‍යා සටහනින් පෙනී යන්නේ 1973 වසර තුල කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය 1972 හා සසඳන විට මුළුමනින්ම සතුටුදයක නොවන බවයි. 1972 දී සහ 1973 දී සෑම ඒකකයක්ම පාහේ පිළිතුරු සැපයූ ඇතැම් අංශයන්හි නිමැවුම් වටිනාකම පහත වැටී ඇත. සමස්ථ කාර්මික සංවර්ධනය පිළිබඳව මේ කර්මාන්ත වැදගත්වන හෙයින් ඒවායේ නිෂ්පාදනය මෙසේ පහත වැටීම තරමක සැලකිල්ලක් ඇති කරවයි. මෙවා නම් යකඩ සහ වානේ මූලික කර්මාන්ත, යන්ත්‍ර සූත්‍ර (විදුලිමය ඒවා හැර) සහ ප්‍රවාහන උපකරණ, ප්ලාස්ටික් නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත සහ විවිධ රසායන ද්‍රව්‍ය නිෂ්පාදිතයි. මෙම කාණ්ඩයන්ට අමතරව විස්කෝතු, කොකෝවා, චොක්ලට් සහ සීනි රස කැවිලි යන උප ගණයද නිමැවුම් වටිනාකමේ සැළකියයුතු අඩුවීමක් පෙන්නුම් කළහ.

## II (ඇ) 3 සංඛ්‍යා සටහන

## 1972/1973 වර්ෂයන් දෙක සඳහා පිළිතුරු සැපයූ ඒකකයන්ගේ කාර්මික නිෂ්පාදන වටිනාකම

| කාර්මික ගණය | සමීක්‍ෂණ ගණන | නිෂ්පාදනය (රු.ද.ලක්ෂ) | | වෙනස සියයට ගණනක් වශයෙන් |
|---|---|---|---|---|
| | | 1972 | 1973 | |
| 1· ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය | 151 | 690·9 | 756·0 | + 9·4 |
| (අ) සැකසූ ආහාර .. .. | 76 | 302·1 | 347·5 | + 15·0 |
| (ආ) එළවළු තෙල් වර්ග සහ මේද .. | 1 | 143·9 | 111·6 | – 22·4 |
| (ඇ) කල්තබාගත හැකි සහ ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස්, මාළු සහ අනෙකුත් මුහුදු ආහාර .. .. | 14 | 10·4 | 11·6 | + 11·5 |
| (ඈ) විස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රස කැවිලි .. .. | 29 | 47·6 | 42·6 | – 10·5 |
| (ඉ) පාන වර්ග .. .. | 5 | 18·5 | 21·1 | + 14·1 |
| (ඊ) ස්ප්‍රීතු .. .. .. | — | — | — | — |
| (උ) දුම්කොළ .. .. | 26 | 168·4 | 221·6 | + 31·6 |
| 2· රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | 339 | 219·1 | 299·1 | + 36·5 |
| (අ) ගොතන ලද ඇඳුම් පැළඳුම්, මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. | 198 | 51·8 | 41·8 | – 19·3 |
| (ආ) නූල් කැටීම, රෙදිපිළි වියීම සහ නිම කිරීම .. | 97 | 125·3 | 212·3 | + 69·4 |
| (ඇ) පාවහන් සහ සම් නිෂ්පාදිතයන් .. | 44 | 42·0 | 45·0 | + 7·1 |
| 3· දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය ගෘහ භාණ්ඩ ඇතුළුව | 4 | 29·0 | 38·7 | + 33·4 |
| (අ) දැව නිෂ්පාදිත .. .. | 3 | 11·0 | 7·3 | – 0·9 |
| (ආ) තුනී ලෑලි .. . | 1 | 18·0 | 31·4 | + 74·4 |
| 4· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ | 23 | 61·3 | 79·0 | + 28·9 |
| 5· රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය | 107 | 519·6 | 484·7 | – 6·7 |
| (අ) කාර්මික රසායන ද්‍රව්‍ය .. .. | 1 | 5·2 | 5·6 | + 7·7 |
| (ආ) විවිධ රසායනික නිෂ්පාදිතයන් .. | 65 | 181·6 | 118·0 | – 35·0 |
| (ඇ) පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන් .. | 1 | 252·4 | 285·2 | + 13·0 |
| (ඈ) රබර් නිෂ්පාදිතයන් .. ., | 29 | 64·8 | 64·4 | – 0·6 |
| (ඉ) ප්ලාස්ටික් නිෂ්පාදිතයන් .. .. | 11 | 15·6 | 11·5 | – 26·3 |
| 6· ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදනය (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | 36 | 135·3 | 168·2 | + 24·1 |
| (අ) පිඟන් බඩු .. . | 1 | 12·9 | 13·1 | + 1·6 |
| (ආ) වීදුරු සහ වීදුරු නිෂ්පාදිතයන් .. | 10 | 11·7 | 12·8 | + 9·4 |
| (ඇ) සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. | 12 | 102·4 | 130·4 | + 27·3 |
| (ඈ) ඉල්මනයිට් නිෂ්පාදනය .. .. | 1 | 3·7 | 4·8 | + 29·7 |
| (ඉ) ගඩොල් සහ උළු .. .. | 12 | 4·8 | 7·1 | + 47·9 |
| 7· මූලික ලෝහ භාණ්ඩ | 1 | 67·5 | 53·2 | – 21·2 |
| (අ) යකඩ සහ වානේ මූලික කර්මාන්ත .. | 1 | 67·5 | 53·2 | – 21·2 |
| 8· සකස්කරන ලද ලෝහ භාණ්ඩ සහ යන්ත්‍රෝප කරණ නිෂ්පාදනය | 183 | 232·8 | 234·7 | + 0·8 |
| (අ) සකස්කරන ලද ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) .. .. | 103 | 81·0 | 81·3 | + 0·4 |
| (ආ) යන්ත්‍ර සූත්‍ර (විදුලි නොවන යන්ත්‍ර සූත්‍ර) සහ ප්‍රවාහන උපකරණ .. .. | 45 | 61·5 | 58·8 | – 4·4 |
| (ඇ) විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම් උපකරණ හා සැපයුම් .. .. | 35 | 90·3 | 94·6 | + 4·8 |
| 9· නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) | 26 | 25·4 | 26·4 | + 3·9 |
| එකතුව | 870 | 1,981·1 | 2,140·0 | + 8·0 |

මූලය; ශ්‍රී ලංකා මහ බැංකුව.

## 3. කර්මාන්ත ව්‍යුහය

II (ඇ) 4 වැනි සංඛ්‍යා සටහනින් 1969/1972 වර්ෂයන් සඳහා ප්‍රධාන ආර්ථික කාණ්ඩයන් අනුව කාර්මික නිෂ්පාදනයේ වටිනාකම පෙන්නුම් කෙරේ.

පසුගිය වසර පහ තුළදී කර්මාන්ත ව්‍යුහය මූලික වශයෙන් නොවෙනස්ව ඇත. කර්මාන්ත ව්‍යුහය තුළ ඇති විශාලතම අංශය පාරිභෝගික භාණ්ඩ කර්මාන්තයි. පාරිභෝගික භාණ්ඩ කර්මාන්තවලට හිමිවන මෙම ප්‍රමුඛත්වය, ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධන අවස්ථාවත්, දේශීය වෙළඳ පොලේ ප්‍රමාණය සහ ස්වභාවයත් පිළිබිඹු කරයි. විශේෂයෙන්ම ආයෝජන භාණ්ඩ අංශයේ පුළුල්වීම පසුගිය වසර පහ තුළදී ඇණහිට ඇත. මෙම අංශයේ පුළුල්වීම තදින්ම සීමාවී ඇත්තේ වෙළඳ පොල පිළිබඳ සීමාවන් සහ කර්මාන්ත වර්ධනයේදී මූලික සංරෝධකය වන විදේශ විනිමය නොමැති කමත් නිසාය. මූලික ලෝහ නිෂ්පාදිත කර්මාන්ත ගැන සළකා බලන විට, අමු ද්‍රව්‍යවලින් සියයට 95 ක්ම ආයාත කරන ලද ඒවා විය.

අන්තර් භාණ්ඩ අංශය 1973 දී සැලෙන දියුණුවක් පෙන්නුම් කර ඇත. මෙම දියුණුව විශේෂයෙන්ම සටහන්වී ඇත්තේ පිළිවෙලින් රුපියල් ලක්ෂ 797 කින් හා රුපියල් ලක්ෂ 439 කින් නිෂ්පාදන වටිනාකම වැඩිවූ ආහාර සැකසුම් සහ නූල් කැටීම, (රෙදිපිළි) යන උප ගණයන් දෙකෙහිය. ප්‍රධාන වශයෙන්ම මෙම උප ගණ දෙකෙහි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් අන්තර් භාණ්ඩවල මුළු වටිනාකම !1972 පැවති රුපියල් ලක්ෂ 8666 සිට 1973 දී රුපියල් ලක්ෂ 10604 දක්වා වැඩිවූ අතර, මුළු නිෂ්පාදන වටිනාකමේ සියයට ගණනක් වශයෙන් 1972 දී වූ සියයට 35.5 සිට 1973 දී සියයට 40·0 දක්වා වැඩි විය.

පාරිභෝගික භාණ්ඩ අංශය නිරපේක්ෂ අගයන් අනුව බලන කළ සිය නිෂ්පාදන වටිනාකම වැඩි කළද, මුළු නිමැවුමෙන් ඊට අයත් වන සාපේක්ෂ කොටස සියයට 3·7 කින් අඩුවුනි. මෙම අංශයේ සැළකිය යුතු ලෙස ප්‍රසාරණයවූ කර්මාන්තයන් නම් දුම්කොළ සහ කඩදාසි නිෂ්පාදිතය ආර්ථිකයේ පවත්නා හිඟයන් සහිත පසුබිමද, ආයාත ආදේශනය කෙරෙහි වැඩි වෙමින් පවතින අවධාරණයද නිසා මෙම අංශයේ නිෂ්පාදන වටිනාකම වැඩිවෙනු ඇති බැව් පැහැදිළිය.

නිමැවුම් වටිනාකම පදනම් කොට කාර්මික ඒකකයන් විශාලත්වය අනුව බෙදී ගිය අයුරු පිළිබඳ දත්තයන් II (ඇ) 5 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ. ඉකුත් වසරට වඩා වැඩි සංකේන්ද්‍රනයක් මෙම සටහන පෙන්නුම් කරයි. 1973 දී නිමැවුමෙන් සියයට 85.7 ක් නිෂ්පාදනය කරන ලද්දේ ආයතන 201 ක් මගිනි. 1972 දී මීට අනුරූපි අගයන් වූයේ සියයට 78·3 ක් සහ 159 කි. තවද ආයතන 817 ක් මුළු කාර්මික නිමැවුමෙන් සියයට 2·2 ක් පමණක් නිපදවූ බව මෙම සටහන දක්වයි. ඉකුත් වසරේදී මෙම කාණ්ඩයේ වූ ආයතන නිපදවූයේ මුළු නිමැවුමෙන් සියයට 12.3 කි. රුපියල් දෙලක්ෂ පණස් දහසේ සිට රුපියල් විසි ලක්ෂය දක්වා නිෂ්පාදන වටිනාකමක් ඇති අන්තර් කාණ්ඩය, සංඛ්‍යාව අතින්ද මුළු නිෂ්පාදනයේ සිය සාපේක්ෂ කොටසද වැඩි කර ගෙන ඇති බව සටහන්කිරීම උචිතය.

## II (ඇ) 4 සංඛ්‍යා සටහන

### 1969–73 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම ප්‍රධාන ආර්ථික ගණ අනුව.

| කාර්මික ගණය | රුපියල් දශ ලක්ෂ | | | | | සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1969 | 1970 | 1971 | 1972 | 1973 | 1969 | 1970 | 1971 | 1972 | 1973 |
| **අ. පාරිභෝගික භාණ්ඩ** | **835·4** | **917·0** | **1101·2** | **1265·0** | **1,275.9** | **51·3** | **47·2** | **49·9** | **51·8** | **48.1** |
| I. ආහාරපාන හා දුම්කොළ | 287·5 | 346·7 | 428 4 | 520·9 | 561·9 | 17·7 | 17·8 | 19·4 | 21·3 | 21·2 |
| අ. සැකසූ ආහාර1 | 45 8 | 82·9 | 139·0 | 189·0 | 182·2 | 2·8 | 4·3 | 6·3 | 7·7 | 6·9 |
| ආ. කල්තැබිය හැකි සහ ටින්වල අසුරන ලද පලතුරු, එළවළු, මස්, මාළු සහ අනෙකුත් මුහුදු ආහාර(2) | 8·6 | 11·8 | 23·2 | 11·5 | 12·5 | 0·5 | 0·6 | 1·1 | 0·4 | 0·5 |
| ඇ. විස්කෝතු සහ රසකැවිලි | 49·9 | 50·5 | 53·1 | 50·2 | 44·3 | 3·1 | 2·5 | 2·4 | 2·1 | 1·7 |
| ඈ. සිසිල් බීම | 17·8 | 26·6 | 26·1 | 21·1 | 22·4 | 1·1 | 1·4 | 1·2 | 10·9 | 0·8 |
| ඉ. අරක්කු, බීර යනාදිය | 59·5 | 68·3 | 62·1 | 75·4 | 72·4 | 3·7 | 3·5 | 2·8 | 3·1 | 2·7 |
| ඊ. දුම්කොළ | 105·9 | 106·6 | 124·9 | 173·7 | 228·1 | 6·5 | 5·5 | 5·6 | 7·1 | 8·6 |
| II. ඇඳුම් පැළඳුම්(3) | 56·0 | 64·3 | 70·8 | 66·7 | 64·1 | 3·4 | 3·3 | 3·2 | 2·7 | 2·4 |
| III පාවහන් සහ සම් භාණ්ඩ | 38·9 | 45·1 | 46·0 | 56·6 | 60·1 | 2·4 | 2·3 | 2·1 | 2·3 | 2·3 |
| IV. විවිධ රසායනික භාණ්ඩ (4) | 155·6 | 155·9 | 230·3 | 213·5 | 161·4 | 9·6 | 8·0 | 10·4 | 8·7 | 6·1 |
| V. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (5) | 13·4 | 13·1 | 18·0 | 40·4 | 74·5 | 0·8 | 0·7 | 0·8 | 1·7 | 2·8 |
| VI සැදූ ලෝහ භාණ්ඩ යන්ත්‍රෝපකරණ හැර (6) | 13·1 | 3·4 | 3·6 | 5·0 | 5·3 | 0·8 | 0·2 | 0·2 | 0·2 | 0·2 |
| VII. ප්ලාස්ටික් භාණ්ඩ | 28·2 | 32·8 | 37·7 | 17·9 | 20·1 | 1·7 | 1·7 | 1·7 | 0·7 | 0·7 |
| VIII. වීදුරු සහ වීදුරු භාණ්ඩ | 7·7 | 8·1 | 13·9 | 11·9 | 12·8 | 0·5 | 0·4 | 0·6 | 0·5 | 0·4 |
| IX. පිඟන් බඩු | 8·7 | 8·0 | 8·5 | 12·9 | 13·1 | 0·5 | 0·4 | 0·4 | 0·5 | 0·5 |
| X. රබර් භාණ්ඩ | 52·8 | 56·4 | 60·2 | 67·7 | 67·8 | 3·2 | 2·9 | 2·7 | 2·8 | 2·6 |
| XI. වියන ලද හා නිමකරන ලද හා රෙදිපිළි | 154·8 | 154·2 | 147·9 | 208·4 | 190·0 | 9·5 | 8·0 | 6·7 | 8·5 | 7·2 |
| XII දව නිෂ්පාදන | 9·2 | 10·4 | 12·8 | 12·7 | 11·6 | 0·6 | 0·5 | 0·6 | 0·5 | 0·4 |
| XIII. නිෂ්පාදිත භාණ්ඩ අන් තැනක සඳහන් නොවූ(7) | 9·5 | 18·6 | 23·1 | 30·4 | 33·2 | 0·6 | 1·0 | 1·1 | 1·3 | 1·3 |
| **ආ. අන්තර් භාණ්ඩ** | **580·8** | **800·3** | **842·8** | **866 6** | **1,060.4** | **35·7** | **41·1** | **38·2** | **35·5** | **40.0** |
| I ආහාර නිෂ්පාදිතයන් (8) | 354·2 | 337·8 | 314·6 | 277·8 | 357·7 | 21·8 | 17·4 | 14·3 | 11·4 | 13·5 |
| II සැදූ ලෝහ භාණ්ඩ යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහණ උපකරණ හැර (9) | 68·9 | 93·5 | 124·4 | 106·1 | 130·3 | 4·2 | 4·8 | 5·6 | 4·3 | 4·9 |
| III. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (10) | 48·9 | 51·9 | 52·3 | 38·7 | 26·5 | 3·0 | 2·7 | 2·4 | 1·6 | 1·0 |
| IV. නූල් කැටීම (රෙදිපිළි) | 17·4 | 19·1 | 41·5 | 62·8 | 106·6 | 1·1 | 0·9 | 1·9 | 2·6 | 4·0 |
| V. තුනී ලෑලි | 8·8 | 10·8 | 13·8 | 18·0 | 31·4 | 0·5 | 0·6 | 0·6 | 0·7 | 1·2 |
| VI. ඉල්මනයිට් නිෂ්පාදිතයන් | 3·1 | 4·7 | 6·2 | 3·7 | 4·8 | 0·2 | 0·2 | 0·3 | 0·2 | 0 2 |
| VII. කාර්මික රසායන (11) | 2·2 | 3·1 | 3·3 | 5·2 | 5·6 | 0·1 | 0·2 | 0·1 | 0·2 | 0·2 |
| VIII. විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම්, උපකරණ සහ සැපයුම් | 66·3 | 88·4 | 88·2 | 94·8 | 109·0 | 4·1 | 4·5 | 4·0 | 3·9 | 4·1 |
| IX. පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන් | 11·0 | 191·0 | 198·5 | 259·5 | 288·5 | 0·7 | 9·8 | 9·0 | 10·6 | 10·9 |
| **ඇ. ආයෝජන භාණ්ඩ** | **210·5** | **227·7** | **263·7** | **310·8** | **315·0** | **13·0** | **11·7** | **11·9** | **12·7** | **11·9** |
| I. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් | 89·0 | 104·8 | 116·7 | 110·4 | 131·4 | 5·5 | 5·4 | 5·3 | 4·5 | 5·0 |
| II. යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර හැර) සහ ප්‍රවාහණ උපකරණ | 77·9 | 70·8 | 57·3 | 98·9 | 102·5 | 4·8 | 3·6 | 2·6 | 4·0 | 3·9 |
| III. ගඩොල් සහ උළු | 14·8 | 13·2 | 31·1 | 34·0 | 27·9 | 0·9 | 0·7 | 1·4 | 1·4 | 1·0 |
| IV. යකඩ සහ වානේ මූලික කර්මාන්ත (12) | 28·8 | 38·9 | 58·6 | 67·5 | 53·2 | 1·8 | 2·0 | 2·6 | 2·8 | 2·0 |
| එකතුව | 1,626.7 | 1,945.0 | 2,207.7 | 2,442.4 | 2,651.3 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය; ශ්‍රී ලංකා මහ බැංකුව.

1. කිරි නිෂ්පාදන, අයිස් ක්‍රීම් සහ ලුණු යනාදිය
2. ජෑම් වර්ග, ජෙලි වර්ග, සෝස් වර්ග, පලතුරු කෝඩියල් යනාදිය
3. කමිස බැනියම් යනාදිය
4. භෛෂජ්‍ය ද්‍රව්‍ය, අංගරාජ, සබන් සහ පවිත්‍ර කිරීමේ සංයෝග, ගිනි පෙට්ටි, දන්තාලේප යනාදිය
5. ලියන කඩදාසි, අභ්‍යාස පොත් යනාදිය
6. ඇලුමිනියම් භාණ්ඩ
7. බුරුසු, ගල්ලෑලි, මුද්‍රණ, බ්ලොක්, සෙල්ලම් බඩු හා සංගීත භාණ්ඩ යනාදිය
8. ගව සහ කුකුල් ආහාර එළවළු තෙල් වර්ග, අයිස්, කපාපු පොල් යනාදිය
9. භාජන, කටු කම්බි කම්බි ඇණ, ගැල්වනයිස් භාණ්ඩ යනාදිය
10. මුද්‍රණ කඩදාසි, කාට්න් අනිකුත් ඇසුරුම් පෙට්ටි සහ ඔතන කඩදාසි
11. කෝස්ටික් සෝඩා සහ ක්ලෝරීන්
12. රෝල් සහ කම්බි භාණ්ඩ

## II (ඇ) 5 සංඛ්‍යා සටහන

## 1973 නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදීගිය අයුරු නිමැවුම් වටිනාකම පදනම් කොට

| කාර්මික ගණය | | නිමැවුම් වටිනාකම | | | |
|---|---|---|---|---|---|
| | | රුපියල් 250,000 ට අඩු | රු. 250,000 සිට රු. ලක්ෂ 2 දක්වා | රු. ලක්ෂ 2 හා ඊට වැඩි | එකතුව |
| I· ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | සමාගම් ගණන | 74 | 96 | 81 | 251 |
| | නිමැවුමේ % ගණන | 0·8 | 11·1 | 88·1 | 100·0 |
| II· රෙදි පිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | සමාගම් ගණන | 430 | 81 | 24 | 535 |
| | නිමැවුමේ % ගණන | 5·4 | 13·6 | 81·0 | 100·0 |
| III· දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) | සමාගම් ගණන | 3 | 2 | 3 | 8 |
| | නිමැවුමේ % ගණන | 0·8 | 2·0 | 97·2 | 100·0 |
| IV· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත | සමාගම් ගණන | 32 | 22 | 9 | 63 |
| | නිමැවුමේ % ගණන | 2·5 | 15·4 | 82·1 | 100·0 |
| V· රසායන ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | සමාගම් ගණන | 95 | 47 | 27 | 169 |
| | නිමැවුමේ % ගණන | 1·6 | 5·7 | 92·7 | 100·0 |
| VI· ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | සමාගම් ගණන | 29 | 35 | 7 | 71 |
| | නිමැවුමේ % ගණන | 1·5 | 10·5 | 88·0 | 100·0 |
| VII· මූලික ලෝහ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | — | — | 1 | 1 |
| | නිමැවුමේ % ගණන | — | — | 100·0 | 100·0 |
| VIII· සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | 129 | 99 | 46 | 274 |
| | නිමැවුමේ % ගණන | 3·7 | 21·5 | 74·8 | 100·0 |
| IX· නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවන) | සමාගම් ගණන | 25 | 19 | 3 | 47 |
| | නිමැවුමේ % ගණන | 6·8 | 52·5 | 40·7 | 100·0 |
| එකතුව | සමාගම් ගණන | 817 | 401 | 202 | 1,419 |
| | නිමැවුමේ % ගණන | 2·2 | 12·1 | 85·7 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

### 4. සේවා නියුක්තිය සහ වැටුප්

1973 දී සමස්ත වශයෙන් කාර්මික අංශයේ සේවා නියුක්ති ප්‍රමාණය 105,715 ක් විය. එසේ වුවද, දුම්කොළ උප ගණයෙහි සේවා නියුක්තිය ඌණ තක්සේරු කොට ඇති බැවින් මෙය සම්පූර්ණයෙන්ම නිවැරදි නොවේ. මේ උප ගණයේ වාර්තාගත ඒකකයන්ගෙන් සමහරක් සිය කාර්යයන් කොන්ත්‍රාත්තු පදනම මත බෙදා හැරි නිසා, දත්ත සැපයීමට අසමත් වී ඇත.

1973 දී මුළු වැටුප් බිලවූ රුපියල් ලක්ෂ 3218, ඉකුත් වසර සඳහාවූ රුපියල් ලක්ෂ 3679 ට වඩා අඩුය. 1973 දී එක් ශ්‍රම දිනක වැටුප රුපියල් 12·89 වූ අතර මෙය ඉකුත් වසරට වඩා සියයට 10·8 ක වැඩිවීමක් දක්වයි. මෙම වැඩිවීමට හේතුව, වැටුප් මණ්ඩල සිය පාලනය යටතේ පවත්නා සේවකයන්ගේ වැටුප් මට්ටම වැඩිකිරීමයි. කර්මාන්ත සහ වානිජ අංශවල සේවකයන්ගේ අවම වැටුප් අනුපාත දර්ශකය 1972 දීවූ 181·4 සිට 1973 දී 199·4 දක්වා වැඩිවී ඇත.

## II (ඇ) 6 සංඛ්‍යා සටහන

## 1973 නිෂ්පාදන සමාගම්, විශාලත්වය අනුව බෙදී ගිය අයුරු-වැටුප් පිරිවැය පදනම් කොට

| කාර්මික ගණය | | රුපි. 15 දහසට අඩු | රුපි. 15 දහස — 50 දහසට අඩු | රුපි. 50 දහස — 500,000 ට අඩු | රුපි. 500,000 සහ වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| I. ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදිත .. .. .. | සමාගම් ගණන .. | 39 | 36 | 153 | 23 | 251 |
| | වැටුප් බිලේ % ගණන .. | 0·3 | 1·2 | 15·6 | 82·9 | 100·0 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ කර්මාන්ත .. | සමාගම් ගණන .. | 334 | 94 | 90 | 17 | 535 |
| | වැටුප් බිලේ % ගණන .. | 3·1 | 3·8 | 21·6 | 71·5 | 100·0 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. .. | සමාගම් ගණන .. | 1 | 2 | 3 | 2 | 8 |
| | වැටුප් බිලේ % ගණන .. | 0·1 | 0·4 | 2·2 | 97·3 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. .. | සමාගම් ගණන .. | 18 | 19 | 22 | 4 | 63 |
| | වැටුප් බිලේ % ගණන .. | 0·8 | 2·9 | 23·1 | 73·2 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත .. .. .. | සමාගම් ගණන .. | 54 | 37 | 59 | 19 | 169 |
| | වැටුප් බිලේ % ගණන .. | 0·6 | 1·6 | 14·3 | 83·5 | 100·0 |
| VI. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. .. .. .. | සමාගම් ගණන .. | 12 | 11 | 40 | 8 | 71 |
| | වැටුප් බිලේ % ගණන .. | 0·2 | 0·7 | 13·3 | 85·8 | 100·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. .. | සමාගම් ගණන .. | – | – | – | 1 | 1 |
| | වැටුප් බිලේ % ගණන .. | – | – | – | 100·0 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදිත .. .. .. | සමාගම් ගණන .. | 54 | 65 | 130 | 25 | 274 |
| | වැටුප් බිලේ % ගණන .. | 0·7 | 3·2 | 39·0 | 57·1 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක නොසඳහන්) .. .. | සමාගම් ගණන .. | 14 | 7 | 23 | 3 | 47 |
| | වැටුප් බිලේ % ගණන .. | 1·3 | 3·2 | 59·0 | 36·5 | 100·0 |
| එකතුව .. .. .. | සමාගම් ගණන .. | 526 | 271 | 520 | 102 | 1,419 |
| | වැටුප් බිලේ % ගණන .. | 0·9 | 2·1 | 20·3 | 76·7 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* බීර හා ස්ටවුට් වලට අදල වැටුප් ලැබී ඇත්තේ ආයතන දෙකක් සම්බන්ධයෙන් පමණි.

වැටුප් බිල මත පදනම්වූ කාර්මික ඒකකයන් විශාලත්වය අනුව බෙදී යාම පිළිබඳ දත්තයන් II (ඇ) 6 වැනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරයි. වැටුප් බිලෙන් ඉමහත් කොටසක් කාර්මික ඒකක සුළු සංඛ්‍යාවක් මගින් ගෙවන ලද බව මෙම සංඛ්‍යා සටහනින් දක්වේ. මෙ ඒකකයන්ගේ නිෂ්පාදන පරිමාවේ සංකෝචනයකින් සේවා නියුක්තිය සහ වැටුප් කෙරෙහි අසමානුපාතික බලපෑමක් ඇති විය හැකි මින් හැගේ.

### 5. අමු ද්‍රව්‍ය භාවිතය

කර්මාන්තයන් විසින් භාවිතා කරන ලද අමු ද්‍රව්‍ය පිළිබඳ දත්තයන් II (ඇ) 7 වැනි සංඛ්‍යා සටහන මගින් පෙන්නුම් කරයි. භාවිතා කළ අමු ද්‍රව්‍යයන්ගේ පිරිවැය, නිෂ්පාදන වටිනාකමින් සියයට 54 ක් වී ඇත. දේශීය අමු ද්‍රව්‍ය භාවිතයෙහි වැඩිවීම, සැළකිය යුතු ලක්ෂණයකි. 1972 දී භාවිතා කළ අමු ද්‍රව්‍යවල මුළු වටිනාකමෙන් සියයට 77·6 ක් ආයාත කළ ඒවා වූ නමුත් 1973 දී එය සියයට 66·7 දක්වා අඩුවී තිබුණි.

## II (ඇ) 7 සංඛ්‍යා සටහන

## ප්‍රධාන ආර්ථික ගණ අනුව අමු ද්‍රව්‍යවල සහ නිෂ්පාදනයේ වටිනාකම

| කාර්මික ගණය | ව්‍යාපාරික ආයතන | නිෂ්පාදනය රුපියල් දශලක්ෂ | අමු ද්‍රව්‍ය | | | |
|---|---|---|---|---|---|---|
| | | | එකතුව | දේශීය | විදේශීය | |
| | | | මුළු වටිනාකම රුපියල් දහස් ගණනින් | වටිනාකම රුපියල් දහස් ගණනින් | වටිනාකම රුපියල් දහස් ගණනින් | සියයට ගණන |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත .. | 120 | 416 9 | 186,408 | 127,506 | 58,902 | 31·6 |
| II. රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | 525 | 281·7 | 146,470 | 46,448 | 100,022 | 68·3 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 7 | 35·1 | 19,901 | 18,025 | 1,876 | 9·4 |
| IV. කඩදසි සහ කඩදසි භාණ්ඩ නිෂ්පාදිත .. | 63 | 100·9 | 55,652 | 17,257 | 38,394 | 69·0 |
| V. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, පෙට්‍රෝලියම්ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත .. | 159 | 474·4 | 296,660 | 56,420 | 240,240 | 81·0 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 48 | 74·6 | 18,551 | 11,314 | 7,237 | 39·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් | 1 | 53·2 | 41,408 | 2,039 | 39,369 | 95·1 |
| VIII. සකස් කළ ලෝහභාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදිත .. | 252 | 261·0 | 150,956 | 25,630 | 125,326 | 83·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක නොයදහන්) | 39 | 19·8 | 11,515 | 4,301 | 7,215 | 62·7 |
| එකතුව .. | 1,214 | 1,717·6 | 927,521 | 308,940 | 618,581 | 66·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## II (ඇ) 8 සංඛ්‍යා සටහන

### නිෂ්පාදනය බල සහ ඉන්ධන — 1973

| කාර්මික ගණය | සමාගම් ගණන | නිෂ්පාදනය (රුපියල් දශලක්ෂ) | පාවිච්චි කළ ඉන්ධන (රුපියල් දහස් ගණනින්) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විදුලි බලය | ගල් අඟුරු සහ ගෑස් | පැට්‍රෝල් සහ තෙල් | අනෙකුත් | එකතුව |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත .. | 86 | 326·0 | 2,992 | 33 | 3,344 | 183 | 6,552 |
| II. රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්තයන් .. | 478 | 276·9 | 2,596 | 937 | 2,369 | 80 | 5,982 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 6 | 3·7 | 48 | — | 15 | 1 | 64 |
| IV කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. | 50 | 97·6 | 3,107 | 13 | 2,723 | 3 | 5,846 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත . | 132 | 186·5 | 1,643 | 61 | 2,342 | 112 | 4,158 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 44 | 74·4 | 2,039 | 84 | 3,811 | 636 | 6,570 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. | 1 | 53·2 | 1,828 | — | 1,670 | — | 3,498 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදිත .. | 241 | 244·1 | 1,848 | 478 | 1,589 | 427 | 4,342 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවන) | 33 | 18·5 | 150 | 10 | 48 | 1 | 209 |
| එකතුව .. | 1,071 | 1,280·9 | 16,251 | 1,616 | 17,911 | 1,443 | 37,221 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ආයාත කරන ලද අමු ද්‍රව්‍ය භාවිතය අඩුවීම බෙහෙවින් කැපී පෙනෙන්නේ ආහාර, පාන වර්ග සහ දුම්කොළ කර්මාන්ත ගණයෙහිය. 1972 දී මෙම ගණය මගින් උපයෝගී කොට ගන්නා ලද ආයාත කරනු ලැබූ අමු ද්‍රව්‍ය ප්‍රමාණය සියයට 70·4 ක්වූ අතර, 1973 දී එම කොටස 31·6 ක් පමණක් විය. මෙම ගණයේ විදේශීය අමු ද්‍රව්‍ය භාවිතය රුපියල් 164,578 සිට රුපියල් 58,902 දක්වා අඩුවූ අතර දේශීය අමු ද්‍රව්‍ය භාවිතය රුපියල් 69,033 සිට රුපියල් 127,506 දක්වා වැඩිවිය.

### 6. බල හා ඉන්ධන පරිභරණය

කර්මාන්ත මගින් භාවිතා කරන ලද ඉන්ධන සහ බල පිළිබඳ දත්තයන් II (ඇ) 8 වැනි සංඛ්‍යා සටහන සපයයි. කර්මාන්තයන්හි මුළු ඉන්ධන පාරිභෝජන පිරිවැය 1972 දී රුපියල් ලක්ෂ 518 ක්වූ අතර එය 1973 දී රුපියල් ලක්ෂ 372 ක් වීමෙන් සියයට 28·2 ක අඩුවීමක් පෙන්නුම් කරයි. කර්මාන්ත මගින් ඉන්ධන භාවිතය සීඝ්‍රයෙන් අඩුවීම අධික ලෙස ඉන්ධන භාවිතය කරන කාර්මික ගණයන්ගේ නිමැවුම් වර්ධනය සාමාන්‍ය වශයෙන් අඩුවීම මගින් පැහැදිලි කළ හැකිය. මෙම ගණයන් නම් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සහ කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිතයි.

7. කර්මාන්ත පිහිටීම

ශ්‍රී ලංකාවේ කර්මාන්තයන්ගේ භූගෝලීය සංකේන්ද්‍රනය II (ඈ) 9 වැනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරයි.

කර්මාන්ත දැඩිව සංකේන්ද්‍රනයවී ඇත්තේ බටහිර පලාතේය. මධ්‍යම සහ දකුණු පලාත් හැරුන විට අනිකුත් පලාත්වලට කාර්මිකකරණයේ බලපෑම් දුනී නැති තරම්ය

කර්මාන්තයන්ට ඉවහල් වන සමහර මූලික පහසුකම් මෙම දුර පළාත්වල නොමැතිවීම මෙම දැඩි සංකේන්ද්‍රනයට හේතුවක් විය හැකිය. කර්මාන්ත ව්‍යුහයෙන් මීට තවත් හේතුවක් සොයා ගත හැකිය. කර්මාන්ත සාමාන්‍යයෙන් ව්‍යාප්තවී ඇත්තේ අමු ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති හැකියාව සහ වෙළඳපොලවල් පදනම් කොට ගෙනය. මේ සාධක දෙකම ශ්‍රී ලංකාවේ කර්මාන්ත වඩා පුළුල් ලෙස ව්‍යාප්ත වීමට බාධකයන්ව පවතී. කෙසේ වුවද විශාල වශයෙන් නාගරිකව කර්මාන්ත සංකේන්ද්‍රනය වීමෙන් පැනනගින සමාජ/ආර්ථික ප්‍රශ්න විසඳීමට හැකිවන බැවින් පුළුල් වශයෙන් කර්මාන්ත විසිරි පවත්වා ගැනීම, මුදුන් පමුණුවා ගත යුතු අරමුණක් වේ. ඉක්මනින් සිත් ඇදගන්නා සුළු නොවන ප්‍රදේශවලට කර්මාන්ත ගෙන යාමක් සිදුවිය යුතු හෙයින් කර්මාන්තයෙහි පුළුල් වශයෙන් භූගෝලීය පැතිරීම සෙමින් සිදුවන ක්‍රියාදමයක් වේ. දේශීය කෘෂිකාර්මික ව්‍යාප්තිය මගින් සිදුවන ආදායම් පුළුල ලෙස බෙදී යාමද පොදු කාය්‍ය පිරිවැය දියුණු කිරීමද මගින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත භූගෝලිකව පැතිරී යාම වඩාත් පහසු හා වේගවත් වෙනු ඇත.

## පළාත් අනුව කර්මාන්තයන්ගේ

| කාර්මික ගණය | බස්නාහිර පළාත | | | උතුරු පළාත | | | නැගෙනහිර පළාත | | | දකුණු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | |
| | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය |
| 1· ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදිත .. | 194 | 859,915 | 38·0 | 8 | 1,477 | 1·3 | 3 | 23,533 | 24·4 | 8 | 15,106 | 21·3 |
| 2· රෙදිපිළි ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්තය .. | 415 | 397,351 | 17·0 | 17 | 2,255 | 2·0 | 5 | 32: | 6·3 | 29 | 14,460 | 20·5 |
| 3· දැව සහ දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 7 | 11,586 | 0·5 | — | — | — | — | — | — | 1 | 31,392 | 44·2 |
| 4· කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත . | 57 | 45,829 | 2·0 | 3 | 370 | 0·3 | 1 | 53,983 | 55·9 | 2 | 763 | 1·1 |
| 5· රසායනික ද්‍රව්‍ය ඛණිජ තෙල් ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 137 | 520,353 | 22·3 | 7 | 7,094 | 6·2 | 1 | 13,105 | 13·6 | 8 | 1,025 | 1·4 |
| 6· ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත (ඛණිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 48 | 74.29. | 3·2 | 2 | 102,049 | 89·0 | 2 | 5,597 | 5·8 | 6 | 3,001 | 4·2 |
| 7· මූලික ලෝහ නිෂ්පාදිත .. | 1 | 53,204 | 2·3 | — | — | — | — | — | — | — | — | — |
| 8· සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහණ උපකරණ .. | 242 | 338,113 | 14·5 | 8 | 1,418 | — | — | — | — | 12 | 5,240 | 7·4 |
| 9· නිෂ්පාදිත භාණ්ඩ අ·ස·නො· .. | 40 | 32,668 | 1·4 | — | — | 1·2 | — | — | — | 2 | 60 | 0·1 |
| එකතුව .. | 1,141 | 2,333,309 | 88·0 | 45 | 114,663 | 4.3 | 12 | 96,541 | 3·6 | 68 | 71,047 | 2·7 |

II (ඇ) 9 වැනි සංඛ්‍යා සටහන

පිහිටීම (1973)

| මධ්‍යම පළාත | | | වයඹ පළාත | | | ඌව පළාත | | | සබරගමු පළාත | | | උතුරු මැද පළාත | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | |
| ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය |
| 23 | 11,577 | 65·5 | 14 | 7,873 | 48·0 | — | — | — | 1 | 136 | 16·3 | — | — | — | 251 | 919,617 | 34·7 |
| 58 | 3,695 | 20·9 | 8 | 2,227 | 13·6 | 4 | 457 | 55·9 | — | — | — | — | — | — | 535 | 420,768 | 15·9 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 8 | 42,978 | 1·6 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 63 | 100,945 | 3·8 |
| 9 | 833 | 4·7 | 3 | 639 | 3·9 | 2 | 361 | 44·1 | 1 | 15 | 11·9 | 1 | 21 | 100·0 | 169 | 543,446 | 20·5 |
| 9 | 1 | ... | 12 | 5,105 | 31·1 | — | — | — | — | — | — | — | — | — | 71 | 190,043 | 7·2 |
| 1 | — | — | 1 | — | — | — | — | — | — | — | — | — | — | — | 1 | 53,204 | 2·0 |
| 6 | 1,093 | 6·2 | 4 | 565 | 3·4 | — | — | — | 2 | 658 | 81·3 | — | — | — | 274 | 347,087 | 13·1 |
| 5 | 468 | 2·7 | — | — | — | — | — | — | — | — | — | — | — | — | 43 | 33,196 | 1·3 |
| 102 | 17,667 | 0·7 | 41 | 66,409 | 0·6 | 51 | 818 | ... | 4 | 809 | ... | 1 | 21 | ... | 1,419 | 2,651·284 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව